

# ගිණුම්කරණය

# 12 ශ්‍රේණිය

## නිපුණතා මට්ටම - 4.5

## වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම.



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# ගිණුම්කරණය



## ගැනුම් ජ'නලය

නැවත විකිණීම සඳහා භාණ්ඩ (වෙළෙඳ ද්‍රව්‍ය ) ණයට ගැනීමේදී එම ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිතා කරන මූලික සටහන් පොත **ගැනුම් ජ'නලයයි.** මෙහිදී භාණ්ඩ ලබා ගැනීම ණයට සිදුවිය යුතු අතර, ඒවා වෙළෙඳ ද්‍රව්‍ය විය යුතුය . මෙම ගනුදෙනු සටහන් කිරීමේදී භාවිතා කරන මූලාශ්‍ර ලේඛනය **ඉන්වොයිසිය** **වන අතර,** එය **ගැනුම් ඉන්වොයිසිය** ලෙසද හඳුන්වයි.

වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීමේදී භාණ්ඩවල ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩු කරන අතර, එය **වෙළෙඳ වට්ටම** නම්වේ. වෙළඳ වට්ටම ගිණුම් ගත නොකරන අතර, වට්ටම අඩු කළ ශුද්ධ වටිනාකම පමණක් මූලික සටහන් පොතෙහි සටහන් කරයි.

<u>එකතු කළ කල අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි නොවූ ආයතනයක ගැනුම් ජ'නලයක ආකෘතිය පහත දැක්වේ.</u>

| දිනය | ඉ.අ | සැපයුම්කරු | වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|
| 1/2 | 04 | ------ | ******* | |
| 1/5 | 27 | ------ | ******* | |
| 1/31 | | ලෙජරයට පිටපත් කළා | ******* | |

ගැනුම් ජ'නලයේ එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීම සඳහා අදාල ද්විත්ව සටහන වන්නේ

ගැනුම් ගිනුම  හර

ණයහිමි පාලන ගිනුම  බැර

**අභ්‍යාස 1:-**

රෙදි අලෙවි කිරීමේ ව්‍යාපාරයක 2020 ඔක්තෝබර් මාසයේ ගැනුම් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 10/04 | ඉ.අ 19 | සුපුල් | 70000 |
| 10/08 | ඉ.අ 45 | රුවන් | 133000 |
| 10/15 | ඉ.අ 241 | චාමින් | 84000 |
| 10/28 | ඉ.අ 640 | නිමල් | 44000 |




ගැනුම් ජ'නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.

අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක ගැනුම් ජ'නලයක ආකෘතිය පහත දැක්වේ.

| දිනය | ඉ.අ | සැපයුම්කරු | වටිනාකම | VAT | මුළු වටිනාකම | ලෙ. පි |
|---|---|---|---|---|---|---|
| | | පොදු ලෙජරයට පිටපත් කළා | ** | ** | **** | |

**ඒ ඒ දිනයන්හි වටිනාකම VATඇතුළත් මුළු ණයහිමි උප ලෙජරයේ අදාළ ණයහිමි ගිණුම්වලට වෙන් වෙන්ව බැර කළ යුතුය.**

**කාලච්ඡේදය අවසානයේ ගැනුම් ජ'නලයේ එකතුව**

ගැනුම් ගිණුම හර (VAT රහිත අගය)
VAT ගිනුම හර (VAT අගය)
ණයහිමි පාලන ගිනුම බැර (VAT සහිත මුළු අගය)




**අභ්‍යාස 2:-**

එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති සෙවන ව්‍යාපාරයේ 2020 ඔක්තෝබර් මස ගැනුම් පහත දැක්වේ.

VAT 8% VAT රහිත අගයන් දී ඇත.

10/02 ඉ.අ 59 පුබුදු 200000
10/08 ඉ.අ 119 නදුන් 78000
10/23 ඉ.අ 36 දිසානායක 130000
10/30 ඉ.අ 940 පෙරේරා 87000

ගැනුම් ජ'නලය පිළියෙළ කර ලෙජරයට පිටපත් කරන්න.


අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ආපසු යැවුම් ජ'නලය

ණයට ගත් වෙළෙඳ භාණ්ඩ විවිධ හේතු මත ආපසු සැපයුම්කරු වෙත යැවිය හැකිය. ඇණවුම් කළ වර්ගයට පටහැනි වීම, ඇණවුම් කළ ප්‍රමාණයට වැඩියෙන් ලැබී ,කල් ඉකුත් වීම වැනි විවිධ හේතු මේ සඳහා ඉවහල් විය හැකිය .

එසේ ආපසු යවන භාණ්ඩ සටහන් කිරීම සඳහා **ආපසු යැවුම් ජ'නලය** මූලික සටහන් පොත ලෙස භාවිතා කරන අතර මූලාශ්‍ර ලේඛනය **හරපත** වේ.

එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ ව්‍යාපාරයක ආපසු යැවුම් ජ'නලය හා අදාළ ද්විත්ව සටහන හා ආකෘතිය පහත දැක්වේ.

ණයහිමි පාලන ගිණුම) හර
ආපසු යැවුම් ගිණුම බැර

ආපසු යැවුම් ජ'නලය

| දිනය | හරපත් අං. | සැපයුම්කරු | වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|
| | | පොදු ලෙජරයට පිටපත් කළා....... | ******* | |

අභ්‍යාස 3 :-

රෙදි අලෙවි කිරීමේ ව්‍යාපාරයක ආපසු යැවුම් පහත දැක්වේ.

හරපත් අංක 12 රුවන් 15000
හරපත් අංක 33 නිමල් 6000

ආපසු යැවුම් ජ'නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.



අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ගිණුම්කරණය



<u>එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක ආපසු යැවුම් ජ'නලය පහත දැක්වේ.</u>

| දිනය | හරපත් අං. | සැපයුම්කරු | වටිනාකම | VAT | මුළු වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|---|---|
| | | පොදු ලෙජරයට පිටපත් කළා... | ***** | **** | ***** | |

<u>**අදාළ ද්විත්ව සටහන්**</u>

ණයහිමි පාලන ගිණුම    හර (වැට් සහිත මුළු අගය)
ආපසු යැවුම් ගිණුම    බැර (වැට් රහිත අගය)
Vat .ගිණුම    බැර (වැට් අගය)

**අභ්‍යාස 4 :-**

එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි සෙවන ව්‍යාපාරයේ 2020 ඔක්තෝබර් මස ආපසු යැවුම් පහත දැක්වේ.

(වැට් 8% ක් වන අතර වැට් රහිත අගයන් දී ඇත.)

10/05 හරපත් අංක 43    පුබුදු    20000
10/25 හරපත් අංක 45    දිසානායක    35000

ආපසු යැවුම් ජ'නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.



අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk